# LEGAL BACKGROUND OF SRI LANKA ACCOUNTING STANDARDS

*S. Madushanka*

*B.Sc (Mgt) Accounting (Special) (U.G)*

*University of Sri Jayewardenepura*

## 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හි (Specified Business Enterprises) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල නිර්දේශ අනුගමනය කළ යුතු බව 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත මඟින් අනාවරණය කෙරේ.

## 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව ස්ථාපිත කර ඇත.

මෙම කමිටුව මඟින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සකස් කිරීම හා ඒවා නිර්දේශ කිරීම සඳහා සහය ලබා දේ.

ClassWork.LK

# 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනතෙහි දැක්වෙන විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත_අධීක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත.

ClassWork.LK

# ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර ඇත් ද යන්න පරීක්ෂා කිරීමේ හා එසේ නොවන්නේ නම් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ බලය ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලයට පැවරී ඇත.

ClassWork.LK

# ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය

## ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ කාර්යභාරය

- සුදුසුකම් ලබා දීම සඳහා විභාග පැවැත්වීම හා ඊට අදාළ අධ්‍යාපන පාඨමාලා නියම කිරීම
- ශිෂ්‍ය අධ්‍යාපනය සහ පුහුණුව අධීක්ෂණය සහ පාලනය
- වෘත්තීය ප්‍රමිත නිසි අයුරු පවත්වා ගෙන යෑම හා ප්‍රමිත පවත්වාගෙන යෑමට
- අවශ්‍ය ක්‍රම සහ පරිචය සාමාජිකයන්ට හඳුන්වා දීම
- ගණකාධිකරණය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳ පර්යේෂණ කිරීම දිරිගැන්වීම
- වෘත්තීය යහපත සහ අභිවෘද්ධිය සුරැකීම
- 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත මඟින් ලැබූ නෛතික බලය මත නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි අවශ්‍යතා සඳහා ප්‍රමිත සකස් කිරීම, පවත්වාගෙන යෑම හා සංශෝධනය.

ClassWork.LK

# අභ්‍යාස

1 ගිණුම්කරණ ප්‍රමිත යන්න කෙටියෙන් හඳුන්වන්න.

2 ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ කාර්යභාරය නම් කරන්න.

3 ගිණුම්කරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලයේ කාර්යයන් නම් කරන්න.

4 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ කාර්යයන් 4ක් නම් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura